# මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS)

# අයදුම්පත් කැඳවීමයි

## අධ්‍යක්ෂ තනතුර

2020 සැප්තැම්බර් 11 දිනැති හා අංක 07/2020 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනයන් සඳහා වූ ජාතික මධ්‍යස්ථානය කලා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයයන්හි උසස් අධ්‍යාපනය ලබාදීම, ප්‍රවර්ධනය කරලීම හා සංවර්ධනය කිරීම අරභයා උසස් හැදෑරීම් සඳහා මධ්‍යස්ථානයක් ලෙස 2005 අංක 02 දරන NCAS ආඥාපනත මගින් ස්ථාපනය කරන ලදී.

අධ්‍යක්ෂ පූර්ණ කාලීන නිලධාරියෙකු වන අතර, මධ්‍යස්ථානයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යයන නිලධාරී සහ ගිණුම් නිලධාරීද වේ. කළමනාකරණ මණ්ඩලයේ සභාපති ද වන අධ්‍යක්ෂ, මධ්‍යස්ථානයේ අධ්‍යයන කමිටුවේ නිලබලයෙන් සාමාජිකයෙකු ද වේ. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාවෙහි යොදවමින්, මධ්‍යස්ථානයට අධ්‍යයන හා පරිපාලනමය නායකත්වය ලබාදීමෙහිලා අධ්‍යක්ෂ වගකිව යුතු වේ. එසේම, මධ්‍යස්ථානයෙහි කළමනාකරණ කටයුතු පිළිබඳ විනිවිදභාවය, වගවීම හා යහපාලනය පවත්වාගෙන යාමෙහි ලාද අධ්‍යක්ෂවරයා වගකිව යුතු වේ. නවෝත්පාදක පර්යේෂණයන් ප්‍රවර්ධනය කරලමින්, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට කලා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ දැනුම උසස් කරගැනීමට උපකාරී වෙමින් මධ්‍යස්ථානය එහි දැක්ම කරා මෙහෙයවීමට අධ්‍යක්ෂවරයා කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වේ. වෙනත් විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අදාළ රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ ආයතනවල අධ්‍යයන විද්වතුන් හා නිලධාරීන් හා සමග සංනිවේදනයෙහි යෙදෙමින් සම්බන්ධීකරණය ඇති කර ගැනීමට හැකියාවද අධ්‍යක්ෂවරයා සතුවිය යුතුය.

**අධ්‍යක්ෂවරයාට ; රු. 108,490-13X2520-141,250, - මසකට**

**(U-AC5(II) වැටුප් පරිමාණය මත වැටුපක් හිමි වේ. දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවන් රාජ්‍ය සේවයේ ඔවුන් ලබන වැටුප් තලයට නොඅඩු වැටුප් තලයක පිහිටුවනු ලැබේ.**

රජයේ රෙගුලාසිවලට අනුකූලව අධ්‍යක්ෂවරයා නිල ප්‍රවාහන පහසුකම් සඳහා සුදුසුකම් ලබයි. තෝරාපත් කරගත් අධ්‍යක්ෂවරයා පත්වීම් ලැබූ දිනයේ සිට වසර තුන (3) කාලකට හෝ ඔහු/ ඇය 65 වන උපන් දිනයට ළඟා වනතුරු තනතුර හොබවනු ඇත.

පත්වීම්ලාභියා ඔහුගේ/ ඇයගේ ඉපැයීම්වලින් 10% කින් විශ්වවිද්‍යාල සේවක අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර, ආයතනය විසින් ඔහුගේ/ ඇයගේ ඉපැයීම්වලින් 15% ට සමාන මුදලකින් මෙම අරමුදලට දායක වනු ඇත. මෙම පත්වීමේ කොන්දේසි හා නියමයන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ (සංශෝධිත පරිදි) විධිවිධානයන්ට සහ ඒ යටතේ සකස් කර අංක 1415/17 හා 2005 ඔක්තෝබර් 12 දිනැති දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ 2005 අංක 02 දරන NCAS ව්‍යවස්ථාවන්ට අනුකූලව පාලනය වනු ඇත.

**අයදුම්කරු පහත දැක්වෙන ලිපිලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 07/2020 හි සඳහන් කර ඇති ලිපිලේඛන.

(ii) **අයදුම්කරුගේ උපන් දිනය ඇතුළත් සම්පූර්ණ ජීව දත්ත ප්‍රකාශනයක්.**

(iii) **ආයතනයේ සංවර්ධනය සඳහා වන ඔහුගේ/ ඇයගේ දැක්ම පිළිබඳ ප්‍රකාශයක් සහ අධ්‍යක්ෂ තනතුරට පත් කරනු ලැබුවහොත් අයදුම්කරු සපුරා ගැනීමට යෝජනා කරනු ලබන කරුණු පිළිබඳව සංක්ෂිප්ත සටහනක්.**

(iv) **අධ්‍යක්ෂ තනතුර සඳහා ඔහු / ඇය තෝරා පත්කරගනු ලැබුවහොත් ඔහු/ ඇය මුදා හැරීමට හැකිද යන බව දන්වා වර්තමාන සේව්‍යයා විසින් නිකුත් කරන ලිපියක්.**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස අවුරුදු 63 ට අඩු විය යුතුය.

රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එවන් අයදුම්කරුවන්ට අවසාන දිනයට හෝ ඊට පෙර තම අයදුම්පත්වල පිටපතක් කලින් ඉදිරිපත් කරන ලෙස තදින් උපදෙස් දෙනු ලැබේ. අයදුම්පත සමග ඥතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

අධ්‍යක්ෂ තනතුර සඳහා යෝග්‍යතාපූර්ණ සියලුම අයදුම්කරුවන්, අවම වශයෙන් විනාඩි දහයක (10) හා උපරිම වශයෙන් විනාඩි පහළොවක් (15) නොඉක්මවන කෙටි ඉදිරිපත් කිරීමක් කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස ආරාධනය කෙරේ.

අයදුම්පත්, කොළඹ 07, වෝඩ් පෙදෙසේ, සුකස්තාන් උද්‍යානයේ 6-A, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන් පිළිබඳ උසස් අධ්‍යයනයන් සඳහා වන ජාතික මධ්‍යස්ථානයේ වැඩබලන අධ්‍යක්ෂ වෙත යොමු කොට 2021.03.25 දින ප.ව. 3.30 ට පෙර, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් ඉහත සඳහන් කාර්යාලයට ගෙනැවිත් භාරදිය යුතුය. **"අධ්‍යක්ෂ තනතුර"** යනුවෙන් ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. අසම්පූර්ණ හෝ අපැහැදිලි හෝ අවසාන දින අවසාන වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

**වැඩබලන අධ්‍යක්ෂ, උසස් අධ්‍යයනය සඳහා වන ජාතික මධ්‍යස්ථානය (NCAS),**
**6A, සුකස්තාන් උද්‍යානය, වෝර්ඩ් පෙදෙස, කොළඹ 07.**
**2021.02.24**